**දුරකථන**/தொலைபேசி இல./Telephone Nos.

අමාත්‍යතුමා / அமைச்சர் / Minister: 2784832, 2784807, 2785617

ලේකම් / செயலாளர் / Secretary: 2784812

කාර්යාලය / அலுவலகம் / Office: 2785141-50, **Fax**: 2784846

ඊමේල්/-மெயில்/E-mail : isurupaya@moe.gov.lk

ඔබේ අංකය / உமது இல. / Your No: ......................................

**අධ්‍යාපන අමාත්‍යාංශය**

**கல்வி அமைச்சு**

**Ministry of Education**

"ඉසුරුපාය" , ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ
බත්තරමුල්ල
'இசுருபாயா' ஸ்ரீ ஜயவர்தனபுர கோட்டை
பத்தரமுல்ல
"Isurupaya", Sri Jayawardhanapura Kotte
Battaramulla.

මගේ අංකය / எமது இல. / My No.: ED/1/1/5/3

දිනය / திகதி / Date: 2016. 04. 07


**චක්‍රලේඛ අංකය: 2016 / 10**

සියලුම පළාත් ප්‍රධාන ලේකම්වරුන්,
සියලුම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,
සියලුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලුම කොට්ඨාස භාර නි.අ.අ./ස.අ.අ.වරුන්
සියලුම විදුහල්පතිවරුන්

# පාසල් දරුවන් සඳහා නාට්‍ය දර්ශන සහ ඒ ආශ්‍රිත වෙනත් වැඩසටහන් පැවැත්වීම විධිමත් කිරීම, ප්‍රමිතිගත කිරීම හා නියාමනය කිරීම

නාට්‍ය හා රංග කලාව සහ භාෂාව හා සාහිත්‍යය යන විෂයයන් යටතේ සිසුන් විශාල පිරිසක් නාට්‍ය කලාව හැදෑරුව ද, විශේෂයෙන් ශ්‍රී ලංකාවේ ප්‍රධාන නගර කිහිපයකින් පරිබාහිරව ප්‍රාදේශීය වශයෙන් නාට්‍ය කලාවේ ව්‍යාප්තිය දුර්වල බැවින් අධ්‍යාපනික කටයුත්තක් වශයෙන් කලාත්මක සහ ගුණාත්මක ප්‍රමිතියෙන් ඉහළ නාට්‍ය නැරඹීම සහ එම විෂයන්ට අදාල උපකාරක වැඩසටහන් පැවැත්වීමේ අවශ්‍යතාව මෙම විෂය සංවර්ධනය සඳහා අත්‍යවශ්‍ය බැව් හඳුනාගෙන තිබේ. ඒ අනුව නාට්‍ය හා රංග කලාව සහ භාෂාව හා සාහිත්‍යය යන විෂයන්ට අදාල නාට්‍ය නිර්මාණ සහ ආශ්‍රිත වැඩසටහන් පැවැත්වීම සම්බන්ධයෙන් මෙතැන් සිට පහත කොන්දේසි ක්‍රියාත්මක කෙරේ.

මීට පෙර **බාහිර පාර්ශ්වයන්ට පාසල් දරුවන් සඳහා නාට්‍ය සහ චිත්‍රපට දර්ශන හෝ වැඩසටහන් පැවැත්වීම ප්‍රමිතිගත කිරීම** යන මැයෙන් අධ්‍යාපන ලේකම්ගේ අත්සනින් 2012. 05. 17 දින නිකුත් කළ 2012/16 දරන චක්‍රලේඛය මෙයින් අහෝසි කෙරෙන අතර, නාට්‍ය දර්ශන සම්බන්ධයෙන් මීට පෙර යම් අවසරයක් ලබා දී ඇත්නම් ඒ සියලු අවසරයන්ද ඒ සමග ම අවලංගු වේ.

## 1.1 පාසල් සිසුන් සඳහා නැරඹීමට සුදුසු නාට්‍ය

1.1.1 රජය විසින් පවත්වන ලද සහ දැනට පවත්වනු ලබන පහත නාට්‍ය උළෙලවල හෝ තරගවල අවසාන වටය හෙවත් ජාතික මට්ටම

අ) අධ්‍යාපන අමාත්‍යාංශය මගින් පැවත්වූ **සමස්ත ලංකා පාසල් නාට්‍ය හා රංග කලා තරගය** සහ මේ වන විට පවත්වනු ලබන **සමස්ත ලංකා පාසල් නාට්‍ය හා රංග කලා උළෙලවල** හොඳම නිෂ්පාදනය ප්‍රථම ස්ථානය ලබාගත් නාට්‍ය (අවසර ඉල්ලා සිටින දිනයේ සිට පූර්වාසන්න වර්ෂ තුනක් ඇතුළත නිෂ්පාදනය වී තිබිය යුතු අතර එම නිර්මාණයට දායක වූ පාසලට පමණක් ඒ සඳහා ඉදිරිපත් විය හැකි ය).

ආ) අධ්‍යාපන අමාත්‍යාංශය මගින් පවත්වන **රාජ්‍ය පාසල් නාට්‍ය උළෙලේ** හොඳම නිෂ්පාදනය ප්‍රථම ස්ථානය ලබාගත් නාට්‍ය. (අවසර ඉල්ලා සිටින දිනයේ සිට පූර්වාසන්න වර්ෂ තුනක් ඇතුළත නිෂ්පාදනය වී තිබිය යුතු අතර එම නිර්මාණයට දායක වූ පාසලට පමණක් ඒ සඳහා ඉදිරිපත් විය හැකි ය).

ඇ) ශ්‍රී ලංකා කලා මණ්ඩලයේ රාජ්‍ය නාට්‍ය අනුමණ්ඩයෙහි දායකත්වයෙන් පැවැත්වූ **රාජ්‍ය ළමා නාට්‍ය උළෙලේ** හොඳම නිෂ්පාදනය ප්‍රථම, දෙවන සහ තෙවන ස්ථානයන් ලබාගත් නාට්‍ය. (අවසර ඉල්ලා සිටින දිනයේ සිට පූර්වාසන්න වර්ෂ තුනක් ඇතුළත **රාජ්‍ය ළමා නාට්‍ය උළෙලට** ඉදිරිපත් ව තිබිය යුතු ය. ඊට වඩා පැරණි නාට්‍ය, එහි නාට්‍ය දර්ශනයක් **රාජ්‍ය නාට්‍ය අනුමණ්ඩලය** වෙත ඉදිරිපත් කොට, අවසර ඉල්ලා සිටින අවස්ථාවෙහි එම නිෂ්පාදනයෙහි පවතින කලාත්මක සහ ගුණාත්මක තත්ත්වය පිළිබඳ ප්‍රමිති සහතිකයක් ලබා ගත යුතු ය).

ඈ) අධ්‍යාපන අමාත්‍යාංශය සහ ටවර් හෝල් රඟහල පදනම එක්ව සංවිධානය කරන **සමස්ත ලංකා පාසල් ටවර් හෝල් නාට්‍ය තරගය** හොඳම නිෂ්පාදනය ප්‍රථම ස්ථානය ලබාගත් නාට්‍ය. (අවසර ඉල්ලා සිටින දිනයේ සිට පූර්වාසන්න වර්ෂ තුනක් ඇතුළත නිෂ්පාදනය වී තිබිය යුතු අතර එම නිර්මාණයට දායක වූ පාසලට පමණක් ඒ සඳහා ඉදිරිපත් විය හැකි ය).

1.1.2 මේ වන විට හෝ මෙයට පෙර පාසල්වල නාට්‍ය හා රංග කලාව, භාෂාව හා සාහිත්‍යය යන විෂයමාලාවන් සඳහා ජාතික අධ්‍යාපන ආයතනය විසින් නිර්දේශිත **පහත සඳහන් නාට්‍යකරුවන්ගේ සහ නාට්‍යවල** නිෂ්පාදන.

| ***නාට්‍යයේ නම*** | ***නිෂ්පාදකගේ/අධ්‍යක්ෂගේ නම*** |
|---|---|
| පුංචි අපට දැන් තේරෙයි | සෝමලතා සුබසිංහ |
| අමර ගියා දිවිය ලෝකෙ | පාලිත ලොකුපෝතාගම |
| මාෂා සහ වළහා | ඩී. කුමාරගේ |
| කදා වළලු | එදිරිවීර සරච්චන්ද්‍ර |
| නරි බෑණා | දයානන්ද ගුණවර්ධන |
| දික්තල කාල ගෝල | පුන්‍යසේන ගුණසිංහ |
| සුභ සහ යස | සයිමන් නවගත්තේගම |
| හස්තිකාන්ත මන්තරේ | එදිරිවීර සරච්චන්ද්‍ර |
| තලමල පිපිලා | ජයලත් මනෝරත්න |
| එලොව ගිහින් මෙලොව ආවා | එදිරිවීර සරච්චන්ද්‍ර |
| මහාසාර | එදිරිවීර සරච්චන්ද්‍ර |
| විකෘති | සෝමලතා සුබසිංහ |
| කුවේණි | හෙන්රි ජයසේන |
| හුණුවටයේ කතාව | හෙන්රි ජයසේන |
| රත්නාවලී | එදිරිවීර සරච්චන්ද්‍ර |
| මගුල් ප්‍රස්තාව | එදිරිවීර සරච්චන්ද්‍ර |
| වෙස්සන්තර | එදිරිවීර සරච්චන්ද්‍ර |
| මූදු පුත්තු | ගුණසේන ගලප්පත්ති |
| තාරාවෝ ඉගිලෙති | ලූෂන් බුලත්සිංහල |
| සිංහබාහු | එදිරිවීර සරච්චන්ද්‍ර |
| මනමේ | එදිරිවීර සරච්චන්ද්‍ර |
| කැලණි පාලම | ආර්. ආර්. සමරකෝන් |
| තොප්පි වෙළෙන්දා | සෝමලතා සුබසිංහ |
| පරාස්ස | විමලරත්න අධිකාරි |
| රාවණේසන් | එස්. මෞනගුරු |

1.1.3 මේ වන විට හෝ මෙයට පෙර පාසල්වල නාට්‍ය හා රංග කලාව, භාෂාව හා සාහිත්‍යය යන විෂයමාලාවන් සඳහා ජාතික අධ්‍යාපන ආයතනය විසින් නිර්දේශිත පහත සඳහන් **විදේශීය නාට්‍යවල දේශීය නිෂ්පාදන.**

| *නාට්‍යයේ නම* | *මුල් නාට්‍ය රචකයාගේ නම* |
|---|---|
| ජුලියස් සීසර් | විලියම් ශේක්ෂ්පියර් |
| ඔතෙලෝ | විලියම් ශේක්ෂ්පියර් |
| මර්චන්ට් ඔෆ් වෙනිස් | විලියම් ශේක්ෂ්පියර් |
| ඩෝල්ස් හවුස් | හෙන්රික් ඉබ්සන් |
| සකුන්තලා | කාලිදාස |
| ඊඩිපස් | සොෆොක්ලීස් |
| ඇන්ටිගනී | සොෆොක්ලීස් |
| ද කොකේසියන් චෝක් සර්කල් | බර්ටෝල්ට් බ්‍රෙෂ්ට් |
| ද ප්‍රපෝසල් | ඇන්ටන් චෙකොව් |
| රත්නාවලී | ශ්‍රී හර්ෂදේව |
| ද චෙරි ඕචඩ් | ඇන්ටන් චෙකොව් |

## 1.2 ඉහත 1.1 යටතේ ආවරණය වන වැඩසටහන් පැවැත්වීම සඳහා අනිවාර්ය කොන්දේසි

1.2.1 ඉහත 1.1.3 වගන්තියට අයත් නාට්‍යවල නිෂ්පාදනයන් එහි ඉහත නම් සඳහන් මුල් නාට්‍ය රචකයාගේ අදාල නාට්‍ය පිටපතට **සෑම අතින්ම අනුකූල වීම** සහ එම නිෂ්පාදනයෙහි කලාත්මක ප්‍රමිතිය සහ පාසල් දරුවන්ට නැරඹීමට සුදුසු බවට **ශ්‍රී ලංකා කලා මණ්ඩලයේ රාජ්‍ය නාට්‍ය අනුමණ්ඩලය** මගින් ලබා දෙන සහතිකය ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ. (ඉහත 1.1.2 හි සඳහන් හෙන්රි ජයසේනයන්ගේ හුණුවටයේ කතාව, එදිරිවීර සරච්චන්ද්‍රයන්ගේ රත්නාවලී සහ මගුල් ප්‍රස්තාව යන නාට්‍ය සඳහා මෙය අදාල නොවන අතර, ඒවාට පාදක මුල් කෘතීන් අනුව සිදු කෙරුණු වෙනත් නිෂ්පාදකයන්ට මෙම කොන්දේසිය අදාල වේ).

1.2.2 ඉහත 1.1.1 ඇ), 1.1.2 සහ 1.1.3 වගන්තිවලට අයත් නාට්‍යවල මුල් කෘතිය/නිර්මාණයන් තමන්ට අයත් නො වේ නම්, තමන්ට ඒවා ඉදිරිපත් කිරීමට ඇති හැකියාවේ නීත්‍යානුකූල බව සනාථ කළ යුතු ය.

## 2.1 ඉහත සඳහන් ප්‍රමිතීන්ට අතිරේක වශයෙන් ඉදිරිපත් කෙරෙන වැඩසටහන්

2.1.1 දැනට ක්‍රියාත්මක නාට්‍ය හා රංග කලා විෂයමාලාවන්හි රස වින්දනාත්මක හා ප්‍රායෝගික කොටස්වලට සෘජුවම අදාල වන ලෙස හෝ විෂය දැනුම පෝෂණය කරන ආකාරයෙන් **පාසල් අධ්‍යාපන හා උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ විෂය ප්‍රවීණයන්** හෝ **ජාතික මට්ටමේ විෂය විශේෂඥයන්** සැකසූ වැඩමුළු සහ ඒ ආශ්‍රිතව රඟ දක්වන නාට්‍ය.

2.1.2 වෙනත් **රජයේ හෝ රජය පිළිගත් ආයතන මගින් පමණක්** සිදු කරන හෝ එම ආයතනවල අනුග්‍රාහකත්වය යටතේ සිදු කරන යම් ප්‍රවර්ධනාත්මක අරමුණු පදනම් කර ගත් (නිද. මත් ද්‍රව්‍ය නිවාරණ, සෞඛ්‍ය, පරිසර යනාදී) **නොමිලේ** ප්‍රදර්ශනය කරන නාට්‍ය.

2.1.3 ඉහත සඳහන් නාට්‍ය වර්ගීකරණයන්ට අයත් නොවන, කලාත්මක ප්‍රමිතියෙන් ඉතා ඉහළ, දරුවන්ට නැරඹීම සඳහා සුදුසු වෙනත් නාට්‍ය නිර්මාණ.

## 2.2 ඉහත 2.1. යටතේ ආවරණය වන වැඩසටහන් පැවැත්වීම සඳහා අනිවාර්ය කොන්දේසි

2.2.1 ඉහත 2.1.1 යටතට අයත්වන වැඩසටහන්වලට අනුමැතිය ලබා දෙන්නේ, ඒ ආශ්‍රිත වැඩමුළුවල පවත්නා අධ්‍යාපනික අදාලත්වය පිළිබඳව ජාතික අධ්‍යාපන ආයතනයේ සෞන්දර්ය දෙපාර්තමේන්තුව සහ අධ්‍යාපන අමාත්‍යාංශයේ සෞන්දර්ය අධ්‍යාපන ශාඛාව එක්ව සිදුකරන සමාලෝචනයකින් පසුව පමණි.

2.2.2 ඉහත 2.1.1, 2.1.2, සහ 2.1.3 වගන්ති යටතට අයත්වන නාට්‍ය පාසල් සිසුන්ට ප්‍රදර්ශනය සඳහා අයදුම් කිරීමේ දී, ඒවායෙහි කලාත්මක ප්‍රමිතිය සහ පාසල් දරුවන්ට නැරඹීමට සුදුසු බවට **ශ්‍රී ලංකා කලා මණ්ඩලයේ රාජ්‍ය නාට්‍ය අනුමණ්ඩලය** මගින් ලබා දෙන සහතිකය ඉදිරිපත් කිරීම ද අනිවාර්ය වේ.

2.2.3 මෙම සියලු නිර්මාණයන් පාසල් පද්ධතියේ පිළිගත් වටිනාකම්වලට හානිකර නොවිය යුතු වේ.

2.2.4 සංස්කෘතික හා සාමාජීය වශයෙන් නොගැලපෙන භාෂා ව්‍යවහාරයන්ගෙන් තොර විය යුතු ය.

2.2.5 මත්ද්‍රව්‍ය හා දුම්වැටි භාවිතයන්, ඝාතනයන් හෝ වධ හිංසා පැමිණවීම්වලට අදාල ප්‍රචණ්ඩකාරී දර්ශන, ගෘහස්ථ හිංසනයන් සහ ලිංගිකත්වය ඉස්මතු කොට පෙන්වන දර්ශන ඉදිරිපත් නොකළ යුතු ය.

2.2.6 ඉදිරිපත් කෙරෙන වැඩසටහන්වල තේමාවන් / කතා වස්තූන් / ගී පද මාලා / දෙබස් ආදිය ජාති, ආගම්, කුල භේදවලට හා වෙනත් සමාජ විරෝධී අරමුණුවලට තුඩු නොදෙන එවැනි අදහස් ගම්‍ය නොවන ඒවා විය යුතු අතර, එවන් අදහස් ගම්‍ය වන පරිදි අර්ථකථනය නො කළ යුතු ය.

2.2.7 තමන් අයත් වන හෝ නියෝජනය කරන ජාති, ආගම්, සංස්කෘතික හා දේශපාලනික මතිමතාන්තර හෝ ප්‍රතිපත්තීන් හේතුකොටගෙන කිසියම් පුද්ගලයෙක්, ආයතනයක් හෝ සමාජ කොට්ඨාසයක් අපහසුවට පත් විය හැකි ආකාරයේ ඉදිරිපත් කිරීම් ඇතුළත් නොවිය යුතු ය.

## 3.0 සුදුසුකම් සපුරන වැඩසටහන් ප්‍රදර්ශනයට අයදුම් කිරීමට අදාල වෙනත් කොන්දේසි

3.1 ඉහත 1.1.1, 1.13, 2.1.1, 2.1.2 සහ 2.1.3 යටතේ ආවරණය වන නාට්‍ය දර්ශන සඳහා අවසර ඉල්ලීමේ දී නාට්‍යයේ පිටපත සමග, ඉහත ප්‍රමිතිගත සුදුසුකම් පිළිබඳව අදාල ආයතන මගින් සහතික කරවාගත් ලේඛන අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කොට ප්‍රදර්ශනය සඳහා නිර්දේශය ලබා ගත යුතු වේ.

3.2 ඉහත 1.1, 1.2 සහ 1.3 යටතේ ආවරණය වන නාට්‍ය නිර්මාණ කලාප මට්ටමින් ප්‍රදර්ශනය කිරීමේ දී, අධ්‍යාපන අමාත්‍යාංශය ද ඇතුළු අදාල සියලු ආයතනවල ලේඛන කලාපයේ කලාප අධ්‍යක්ෂවරයා වෙත අනිවාර්යයෙන් ම ඉදිරිපත් කොට අවසර ලබා ගත යුතු වේ.

3.3 පාසල පිහිටි ප්‍රදේශය ආසන්න රංග ශාලාවක පාසල් කාල වේලාව තුළ පැවැත්වෙන නාට්‍ය දර්ශනයක් නම්, එම නාට්‍යය නැරඹීම **විෂයානුබද්ධ වශයෙන් අත්‍යවශ්‍ය වන** සිසු දරුවන් පමණක් **දෙමාපියන්ගේ එකඟතාව** මත සහ එම විදුහල අයත් කලාපයේ **කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ පූර්ව අවසරය මත** රැගෙන යා හැකි ය. විදුහලකට මෙම අවස්ථාව ලබා දිය හැක්කේ පාසලේ කටයුතුවලට සහ සිසුන්ගේ අධ්‍යාපන කටයුතුවලට හානිකර නො වන පරිදි **වර්ෂයකට දෙවතාවක්** පමණි.

3.4 ඉහත 1.1 සහ 2.1. යටතේ ආවරණය වන යම් වැඩසටහනක් පාසල් කාල වේලාවේ දී යම් **පාසලක් තුළ** පවත්වෙන්නේ නම්, එම විදුහල අයත් කලාපයේ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ පූර්ව අවසරය මත එය සිදු කළ යුතු ය. විදුහලකට මෙම අවස්ථාව ලබා දිය හැක්කේ **වර්ෂයක පළමු හා දෙවන පාසල්වාර ඇතුළත පමණක් වන අතර, එය ද වර්ෂයකට දෙවතාවක් පමණි.**

3.5 දරුවන්ගේ ආරක්ෂාව පිළිබඳ වගකීම ඒ සඳහා යෙදෙන ගුරුභවතුන් වෙත පැවරෙන අතර, අධ්‍යාපනික අවශ්‍යතාවන් මත පදනම් වන මෙම කටයුතුවල සමස්ත වගකීම, නියාමනය හා අධීක්ෂණය අදාල විදුහලේ විදුහල්පති සහ එම විදුහල අයත් කලාපයේ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත පැවරේ.

3.6 ඉහත 3.2 සහ 3.3 කොන්දේසිවලින් ආවරණය වන අවස්ථාවන් සම්බන්ධයෙන් අදාල කලාපයේ කලාප අධ්‍යක්ෂගේ විධිමත් අවසර ලිපියක් නොමැතිව හුදෙක් නාට්‍ය දර්ශන සංවිධායකවරුන්ගේ ලිපි ලේඛන හෝ ආරාධනාවන් අනුව කටයුතු කිරීම සපුරා තහනම් වේ.

3.7 තම කලාපයේ පැවැත්වීමට අවසර ලබා දෙනු ලබන වැඩසටහන් පිළිබඳව, අදාල කලාපයේ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ අනිවාර්යයෙන්ම තම පළාතේ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ හා පළාත් අධ්‍යාපන ලේකම් දැනුවත් කළ යුතු ය.

3.8 අවසර ලබා දුන් වැඩසටහනක් සම්බන්ධයෙන් වුව ද පැමිණිලි හා චෝදනා ඉදිරිපත් වේ නම්, කරුණු පිරික්සා බලා ඕනෑම මොහොතක වහාම එම අවසරය අවලංගු කළ හැකි අතර එසේ අවලංගු කරන ලද වැඩසටහනකට මින් පසු කිසිදු අවස්ථාවක ඒ සඳහා යළි අවසර ලබා නොදිය යුතු ය. එය අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් වෙත නොපමාව දැනුම් දිය යුතු ය.

3.9 මෙම වැඩසටහන් මගින්, පාසලක ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට මෙන් ම එහි විනයට ද කිසිදු ආකාරයක බාධාවක් ඇති නොවිය යුතු අතර ඒ ආශ්‍රිතව පාසලට අදාල චක්‍රලේඛ, නීති රීති, ව්‍යවස්ථා හා මූල්‍ය පරිපාටීන් කිසිවක් ද උල්ලංඝනය නොවිය යුතු ය.

3.10 වැඩසටහනේ පිරිවැය සඳහා නාට්‍ය සංවිධායකයන් මුදලක් අය කරන්නේ නම්, (2.1.2 හැර) කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ අනුමැතිය යටතේ ඉතා සාධාරණ සහන මුදලක් ප්‍රවේශ පත්‍රයක් සඳහා අය කළ යුතු ය. එක් නාට්‍ය දර්ශනයක් සඳහා අලෙවි කරනු ලබන ටිකට්පත් සංඛ්‍යාව සහ එය වේදිකාගත කරන ශාලාවේ ආසන සංඛ්‍යාව සමාන විය යුතු අතර එය එම රංග ශාලාව අයත්වන අධ්‍යාපන කලාපයේ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ පූර්ව අනුමැතියට ඉදිරිපත් කොට අවසර ලබා ගත යුතු ය.

3.11 ප්‍රවේශ පත්‍ර මිල දී ගැනීම සඳහා සිසු දරු දැරියන්ට හා දෙමාපියන්ට බල කිරීම සපුරා තහනම් ය.

3.12 දර්ශනය සඳහා අදාල ශාලාවට සිසු දරු දැරියන් ඇතුළත් කිරීමේ දී, කිසිදු අපහසුවකින් තොරව ශාලාව තුළ රැඳිය හැකි ප්‍රමාණය පමණක් ඊට ඇතුළු කළ යුතු ය.

3.13 පාසලක් තුළ නාට්‍ය දර්ශනයක් පැවැත්වීමට අවසර ලත් නාට්‍යයකට **පාසල් කාල වේලාව තුළ** දී පැවැත්වීමට අවසර ඇත්තේ එක් නාට්‍ය දර්ශනයක් පමණි.

3.14 මෙම චක්‍රලේඛයට අනුව ප්‍රදර්ශනය සඳහා අනුමත වූ නාට්‍යවලට හැර අන් කිසිදු නාට්‍යකට **"පාසල් දර්ශන"** යනුවෙන් තම පූර්ව ප්‍රචාරක කටයුතු සිදු කිරීම සපුරා තහනම් වේ. චක්‍රලේඛයට අනුව ප්‍රදර්ශනය සඳහා අනුමත වූ නාට්‍යවලට යම් අධ්‍යාපන කලාපයක් ආශ්‍රිතව "පාසල් දර්ශන" යනුවෙන් පූර්ව ප්‍රචාරක කටයුත්තක් සිදු කළ යුත්තේ ද අදාල කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ පූර්ව අවසරය යටතේ පමණි.

3.15 මෙම චක්‍රලේඛයේ කොන්දේසිවලට අනුකූලව අවසර ලබා ඇති නාට්‍ය පිළිබඳ තොරතුරු www.moe.gov.lk දරන අධ්‍යාපන අමාත්‍යාංශයීය වෙබ් අඩවියේ ප්‍රසිද්ධ කෙරෙනු ඇත.

3.16 ඉහත ආකාරයට ප්‍රසිද්ධ කොට නොමැති, මෙම චක්‍රලේඛයේ කොන්දේසිවලට අනුකූල නොවන පරිදි "පාසල් දර්ශන" යනුවෙන් තම පූර්ව ප්‍රචාරක කටයුතු සිදු කරන කිසිදු නාට්‍ය දර්ශනයක් සඳහා **පාසල වෙනුවෙන්** තම දරුවන් සහභාගී කරවීම තහනම් වේ.

3.17 ගුරු සුභසාධන කටයුතුවලට සහ ආදි ශිෂ්‍ය සංගම්වලට අරමුදල් සපයා ගැනීමේ අරමුණෙන් **සිසුන්ට** ටිකට් පත් අලෙවි කරමින් මෙම නාට්‍ය දර්ශන පැවැත්වීම තහනම් වේ.

3.18 මෙම චක්‍රලේඛයේ කොන්දේසි උල්ලංඝනය වන පරිදි අධ්‍යාපන ක්ෂේත්‍රයේ යම් කිසිවෙක් කටයුතු කරන්නේ නම් ඔහුට හෝ ඇයට එරෙහිව විනයානුකූලව පියවර ගනු ලැබේ.

මෙම චක්‍රලේඛයෙන් ආවරණය නො වන යම් කරුණක් වේ නම් ඒ පිළිබඳ අවසාන තීරණය රේඛීය අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් සතු වේ.

**ඩබ්ලිව්. එම්. බන්දුසේන**
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය